**ජාතික යොවුන් සේනාංකය - 2018**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කල මතය**

ජාතික යොවුන් සේනාංකයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සේනාංකය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සේනාංකය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සේනාංකයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සේනාංකයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සේනාංකයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සේනාංකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සේනාංකයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සේනාංකයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සේනාංකය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රමිත අංක 07 හි 87 (අ) වන ඡේද අනුව අස්ථිත්වය සතු වත්කම් වල අයිතිය මත පැනවී ඇති සීමාවන් පිළිබඳව හෙළිදරව් කිරීම් සිදු කළ යුතු වුවත් සේනාංකයේ පැවති රු.331,030,233 ක් අගය වූ ගොඩනැගිලි පිහිටි ඉඩම්වල හිමිකම පවරා ගෙන නොතිබුණු අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යටතේ ජාතික යොවුන් සේනාංකය විසින් පරිහරණය කරනු ලබන ගොඩනැගිලි පිහිටි ඉඩම්වල හිමිකම් පවරා ගෙන නොතිබුණ නමුත්, 2011 වර්ෂයේ සිට එම වත්කම් ඉදිකිරීමට භාවිතා කරනු ලබන ප්‍රාග්ධන ප්‍රතිපාදන සියයට 5 ක ක්ෂය ප්‍රතිපාදන යටතේ ක්ෂය කරන බවට හෙලි දරව් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව නියමිත හෙලිදරව් කිරීම් සිදු කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 21 (ඊ) ඡේදය ප්‍රකාරව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුලත් සටහන් හා අනෙකුත් විස්තරාත්මක සටහන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතු වුවද, රාජ්‍ය ප්‍රදාන ලැබීම් වලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. | - එම - |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සේනාංකයේ පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීමට අදාලව ඉංජිනේරු සේවා සැපයීම වෙනුවෙන් ගොඩනැගිලි | 2018 වර්ෂයේදී ගොඩනැගිලි ඉදිකිරීමට අදාල ඉංජිනේරු සේවා සැපයීම වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |

| | |
|---|---|
| දෙපාර්තමේන්තුවට ගෙවියයුතු රු.100,653,154 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් ජංගම වගකීම සහ නොනිමි වැඩ අඩුවෙන් දක්වා තිබුණි. | 100,653,154 ක් ගෙවිය යුතු වුවත් එය ගිණුම් වාර්තාවෙහි සඳහන් කිරීමට අතපසු වී ඇති බව පිළිගනිමි. 2019 වාර්ෂික ගිණුම් සකස් කිරීමේදී අදාල නිවැරදි ගැලපුම් සිදු කර ඇත. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 103 හා 104 | සමාලෝචිත වර්ෂය තුළදී වාහන 07 කට අදාලව වාහන අනතුරු 08 ක් සිදුවී තිබුණද වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් වූ මු.රෙ. 103 හා 104 ප්‍රකාරව කටයුතු මේ වන විට සිදු වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>- 5.1 ඡේදය<br>- 6.5.1 ඡේදය | සේනාංකය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.<br>ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සේනාංකය විසින් නියමිත දිනට වර්ෂ 02 ක් ප්‍රමාද වී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන 100 ක් දක්වා වැඩි කිරීමේ සැලසුමත් සමඟ ඉදිරි වර්ෂයන් සඳහා වන සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අදාල කටයුතු සකස් කරන ලද නමුත් මේ වන විට ජාතික යොවුන් සේනාංක අධිකාරී පනත සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති බැවින් ද, ඒ සඳහා ඉදිරි කටයුතු සිදු වෙමින් ද පවතින අතර, නව අධිකාරී පනතත් සමඟ සංයුක්ත සැලස්මක් සකස් කර ඉදිරිපත් කිරීමට නියමිත බවත් පෙන්වා දෙමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |
| (ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා | I. පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තියට අනුකූලව ආයතනය විසින් පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය පිළියෙල කර එය ක්‍රියාත්මක කර | ජාතික යොවුන් සේනාංකය සඳහා පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කර නොතිබූ බව පිළිගනිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | | නොතිබුණි. | | |
| | II. | පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය පිළියෙල කිරීම හා ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථානයන්හි අප ආයතනයේ දැක්ම , මෙහෙවර හා අප විසින් සිදු කරනු ලබන සේවාවන් පිළිබඳවද ප්‍රදර්ශනය කර තිබේ. | -එම- |
| | III. | සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොමැති අතර කඩිනමින් අදාල ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරනු ලබන බව ද දන්වා සිටිමි. | -එම- |
| | IV. | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර නොතිබුණි. | මෙම වැඩකටයුතු වල වගකීම අතිරේක අධ්‍යක්ෂවරයකු වෙත පවරා ඇත. ඉදිරියේදී එම වගකීම පැවරීම සඳහා නිළධාරියෙකු පත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.56,093,422 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 73,070,284 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 129,163,706 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මුළු වියදම රු. 182,628,694 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට සේනාංකය විසින් ප්‍රාදේශීයව පුහුණු මධ්‍යස්ථාන 49 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර, එම මධ්‍යස්ථාන පිහිටි ඉඩම් වල ප්‍රමාණය හෙක්ටයාර් 116.8769 විය. රජයේ දෙපාර්තමේන්තුවලට ඉඩම් ලබා දීම පිළිබඳ සහතික මගින් මධ්‍යස්ථාන 06 කට | යොවුන් සේනාංකය ආරම්භයේදී ප්‍රාදේශීය ලේකම්වරු (රජය), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය යන ආයතන භාරයේ තිබූ | ඉඩම් පවරා ගැනීම හා ගිණුම්ගත කිරීම අප්‍රමාදව සහ විධිමත් පරිදි සිදු කල යුතු වීම. |

| | |
|---|---|
| අදාලව ඉඩම් හෙක්ටයාර් 10.8859 සේනාංකයට පවරා දී තිබුණු නමුත් ඒවායේ වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. මධ්‍යස්ථාන 35 කට අදාළ ඉඩම් පවරා ගැනීමේ කටයුතු ඉතා සෙමින් ක්‍රියාත්මක වෙමින් තිබුණි. වෙනත් ආයතනවලට අයත් ඉඩම්වල පිහිටි ගොඩනැගිලිවල මධ්‍යස්ථාන 08 ක් පවත්වාගෙන ගොස් තිබුණි. නමුත් මෙම මධ්‍යස්ථාන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි ගොඩනැගිලි හා ගොඩනැඟිලි වැඩි දියුණු කිරීම් වශයෙන් රු.128,934,770 ක් සහ 2018 දෙසැම්බර් 31 දිනට නොනිමි ප්‍රාග්ධන වැඩ වශයෙන් රු.1,694,222,933 ක් වැය කර තිබුණි. | හිස් ඉඩම් මෙන්ම ගොඩනැගිලිද සහිත ඉඩම් ලබා ගෙන යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කරන ලදී. එම ඉඩම් හා ගොඩනැගිලි එම අවස්ථාවේදී විධිමත්ව පවරා ගැනීමක් සිදු කර නොමැත. මේ වන විට මෙම ඉඩම් විධිමත්ව පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.2018.12.31 වන විට යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන 06 ක් පිහිටුවා තිබූ ඉඩම් විධිමත්ව පවරා ගැනීමට අදාළ කටයුතු සම්පූර්ණ කර ඇති අතර මේ වන විට එම සංඛ්‍යාව 18 දක්වා ඉහළ නංවා ගැනීමට හැකි වී ඇත. එමෙන්ම තවත් මධ්‍යස්ථාන 02 ට අයත් ඉඩම් අදාළ කටයුතු බොහෝ දුරට අවසන්ව ඇත. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පුහුණු මධ්‍යස්ථාන 49 ක් සඳහා 2019 කණ්ඩායම සඳහා 3750 ක් සහ දෙවන කණ්ඩායම සඳහා 3750 ක් වශයෙන් කණ්ඩායම් දෙක සඳහා පුහුණුලාභීන් 7500 බඳවා ගැනීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථාන 49 ක් සඳහා කණ්ඩායම් දෙක බැගින් පුහුණුලාභීන් 7,271ක් බඳවා ගෙන තිබුණු අතර එයින් බඳවාගත් පුහුණුලාභීන්ගෙන් 1,883 ක් එනම් සියයට 26 ක් පාඨමාලාව හැර ගොස් තිබුණු අතර පාඨමාලාව සාර්ථකව නිමකල සංඛ්‍යාව 5,388ක් විය. කන්තලේ මධ්‍යස්ථානයේ පළමු කණ්ඩායම සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි නොවූ බැවින් පුහුණුලාභීන් බඳවාගෙන නොතිබුණි. මධ්‍යස්ථානවල එක් පන්ති කාමරයකට සිසුන් 50 බැගින් පන්ති කාමර 4 ක් සඳහා පුහුණුවීම් පහසුකම් සලසා තිබුණද මධ්‍යස්ථාන 35 ක සිසුන් සංඛ්‍යාව 50 ට අඩු බැවින් එම මධ්‍යස්ථානවල සම්පත් ඌන උපයෝජිතව පැවතුණි. තවද එක් එක් මධ්‍යස්ථානය වෙනුවෙන් පිරිවැය ගණනය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි | කණ්ඩායම් 02 සඳහා පුහුණුලාභීන් 7271 බඳවා ගෙන ඇත. මේ අනුව අපේක්ෂා කල ප්‍රමාණයෙන් සියයට 97 ක් බඳවා ගෙන ඇති බව පෙන්වා දෙමි.<br>ඒ අනුව 2018 පාඨමාලාව සාර්ථකව නිම කල සංඛ්‍යාව 5388 වශයෙන් පෙන්වා දිය හැක. ඒ අනුව පාඨමාලාවේ සාර්ථකත්වය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 4.3 න් වර්ධනය වී ඇත.<br>සියලුම මධ්‍යස්ථානයන්හි පාඨමාලාව සාර්ථකව නිම කල සංඛ්‍යාව 5833 වන අතර, සමස්ථයක් ලෙස බඳවාගත් ප්‍රමාණයට සාපේක්ෂව සියයට 80 ක සාර්ථකත්වයක් ලබා ගෙන ඇති බව පෙන්වා දිය හැක. | අපේක්ෂිත කාර්ය සාධන ඉලක්ක වෙත ලඟා වීම සඳහා අවශ්‍ය කළමනාකරණය කල යුතු වීම. |

## 3.3 වත්කම් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂය ආරම්භ කිරීමට නියමිතව තිබූ මධ්‍යස්ථාන වල රාජකාරි කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට එකක් රු.650,000 බැගින් මිලදී ගත් ත්‍රිරෝද රථ 18 ක් මධ්‍යස්ථාන වල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් 2019 වර්ෂයේදී ත්‍රි රෝද රථ 3 ක් සේනාංකයේ පරිබාහිර ආයතනයක් වූ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙතද ත්‍රි රෝද රථ 2 ක් ප්‍රධාන කාර්යාලය වෙතද භාරදී තිබුණි. 2022 පෙබරවාරි මස ඉතිරි ත්‍රි රෝද රථ 13 ක් පලාත් කාර්යාල 09 ක්, පුහුණුවීම් මධ්‍යස්ථාන 03 ක් සහ ප්‍රධාන කාර්යාලය වෙත ලබාදී තිබුණි. | විවෘත කිරීමට නියමිතව තිබූ මධ්‍යස්ථාන වල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වූ නිසා ත්‍රිරෝද රථ 18 ක් ගබඩාවේ ගාල් කර තබන ලදී. එසේ තබන ලද ත්‍රිරෝද රථ 18 න් 13 ක් මේ වන විට පුහුණු මධ්‍යස්ථාන වෙත බෙදා දී ඇති බව පෙන්වා දෙමි. එසේම ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ඉතිරි ත්‍රිරෝද රථ අතුරින් රථ 03 ක් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත භාර දී ඇත. ඉතිරි ත්‍රිරෝද රථ යොවුන් සේනාංක මූලස්ථාන වාහන සංචිතයේ රාජකාරී සඳහා යොදවා ඇති බවත් පෙන්වා දෙමි. | අපේක්ෂිත අරමුණු සැලසුම් කළ පරිදි ඉටු කිරීම සඳහා ඵලදායී අයුරින් වත්කම් කළමනාකරණය කල යුතු වීම. |
| (ආ) 2018 ජනවාරි 01 දිනට පැවති නිල ඇඳුම් තොගයේ වටිනාකම රු.23,357,753 ක් වූ අතර එයින් රු.13,888,735 ක් වටිනා නිළ ඇඳුම් භාවිතයට ගෙන තිබුණි. වර්ෂය තුළ නිම් ඇඳුම් අවශ්‍යතාවය වසර මුල පැවති තොගයෙන් සියයට 59 ක ප්‍රතිශතයක් පමණක් වුවද අවශ්‍යතාවය ඇගයීමකින් තොරව 2018 වර්ෂය තුළ රු.3,078,685 ක් වූ නිල ඇඳුම් නැවත මිලදී ගෙන තිබුණි. | ජාතික යොවුන් සේනාංකය විසින් ආරම්භ කරනු ලැබූ නියමු ව්‍යාපෘතිය මඟින් දිවයින පුරා පුහුණු මධ්‍යස්ථාන 75 ක් ආරම්භ කරමින් 2018 වර්ෂය සඳහා පුහුණු ලාභීන් 30,000 ක ප්‍රමාණයක් බඳවා ගැනීමට සැලසුම් සකස් කරන ලදී. එම බඳවා ගැනීමට අපේක්ෂිත මුළු ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් එම පිරිස සඳහා තොගයේ තිබූ නිළ ඇඳුම් ප්‍රමාණවත් නොවූ බැවින්, කැන්වස් සපත්තු 2,252 ක් ටී ෂර්ට් 750 සහ බඳ පටි 5,620 ක ප්‍රමාණයන් මිලදී ගැනීමට කටයුතු සිදු කරන ලදී.<br>සැලසුම් කරන ලද සමස්ථ පුහුණු මධ්‍යස්ථාන අතුරින් බොහොමයක ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් සැලසුම් කරන ලද පුහුණුලාභීන් ප්‍රමාණයම බඳවා ගැනීමට නොහැකිවීම තුල අතිරේක තොග ප්‍රමාණයක් භාණ්ඩ සමීක්ෂණ සිදු වන අවස්ථාව වන විට පැවැති නමුත්, මේ වන විට එම තොගයන් භාවිතයට ගෙන ඇත. | විධිමත් සැලසුමකට සහ අරපිරිමැසුම් දායක ලෙස තොග මිලදී ගැනීමට කටයුතු කිරීම සහ වත්කම් ඵලදායි ලෙස කළමනාකරණය කල යුතු වීම. |

**3.4 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) නව මධ්‍යස්ථාන 12 ක් ආරම්භ කිරීම අත්‍යවශ්‍ය හා හදිසි කටයුත්තක් ලෙස සලකා භාණ්ඩ මිලදී ගෙන තිබුණද එම මධ්‍යස්ථාන ආරම්භ කිරීම සිදු නොවීම හේතුවෙන් මිලදී ගත් භාණ්ඩ ගබඩාකර තැබීම වෙනුවෙන් ගබඩා කුළී, රක්ෂණ ගාස්තු, ආරක්ෂක සේවා ගාස්තු, වැටුප් හා කෘමින් මර්ධනය කිරීමේ ගාස්තු වශයෙන් 2019 මැයි දක්වා රු.5,147,125 ක් නිෂ්කාර්යව වැය කර තිබුණි. | 2016 හා 2017 වර්ෂයන්හිදී නියමු ව්‍යාපෘතිය යටතේ නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට කටයුතු සිදු කරන ලදී. ඒ අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය හා තවත් පුද්ගලික ආයතනයන් වෙත ඉදි කිරීම් කටයුතු පිරිනමන ලදී. එසේ ඉදි වන නව පුහුණු මධ්‍යස්ථාන 2017 වර්ෂයේ අවසන් භාගයේදී ආරම්භ කිරීමට සැලසුම් කරමින්, එවකට සිටි අධ්‍යක්ෂවරුන්ගේ උපදෙස් මත එම මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සිදු විය.<br>ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සතු ඉදි කිරීම් කටයුතු ප්‍රමාද වීම හේතු කොට ගෙන එම වර්ෂයන් තුල මිලදී ගනු ලැබූ භාණ්ඩ ඉදිරියේදී භාවිතයට ගත හැකි වන පරිදි සුරක්ෂිතව පවත්වා ගැනීම අනිවාර්යය විය. ඒ අනුව 2019 වර්ෂයේ මැයි මස දක්වා රුපියල් 5,147,125/- ක වැයක් දැරීමට සිදු වූ බව පිළිගනිමි. | නිවැරදිව සැලසුම් සකස් කිරීම, ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හා වියදම් ඵලදායීව කළමනාකරණය කල යුතු වීම. |
| (ආ) මීගහකිවුල හා පැල්මඩුල්ල යෝජිත යොවුන් සේනාංක මධ්‍යස්ථාන ඉදිකිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස පිළිවෙලින් රු.19,662,001 ක් හා රු 17,018,461 ගෙවීම් සිදුකර තිබුණු නමුත් ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්න මත එම ඉදිකිරීම් අවලංගුකර ඇතත් අත්තිකාරම් මුදල් 2021 දෙසැම්බර් 31 දිනටද අයකරගෙන නොතිබුණි. | මීගහකිවුල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් ගෙවා ඇති අත්තිකාරම් ඇපකර ලබා ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන අතර, ඒ සඳහා නිරවුල්කරුවෙකු වෙත යොමුකර ඇත. ඒ අනුව අත්තිකාරම් මුදල් අයකර ගැනිමට ඉදිරි කටයුතු සිදුකරනු ඇත. | කාර්යක්ෂමව හා විධිමත් පරිදි කොන්ත්‍රාත් කළමනාකරණය සිදු කළ යුතු වීම |
| (ඇ) වැලිමඩ මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු, ඉඩමේ පිහිටීම හා භූ විෂමතා හේතුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම්වල අස්ථාවර අවදානම් තත්ත්වයක් පැන නැගිම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නවතා දමා ඇතත් අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු.19,259,020ක් 2021 දෙසැම්බර් 31 දින වන විට අයකර ගෙන නොතිබුණි. | වැලිමඩ පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් ගෙවා ඇති අත්තිකාරම් ඇපකර ලබා ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන අතර, ඒ සඳහා නිරවුල්කරුවෙකු වෙත යොමුකර ඇති බැව් දන්වා සිටිමි. ඒ අනුව අත්තිකාරම් මුදල් අයකර ගැනිමට ඉදිරි කටයුතු සිදුකරනු ඇත. | එම |